# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2040/42 - 2017 ඔක්තෝබර් මස 13 වැනි සිකුරාදා - 2017.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ඩබ්ලිව්එල්පී/එල්ඒඑන්/එෆ්එල්ඩීඕ4/ඒසීකිව්/08.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/6/2013/එච්ඩබ්ලිව්/681.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙරලැලිය ගමේ, අංක. 375ඩී බෙරලැලිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක. 2680 හා 2017.05.02 දිනැති මූලික පිඹුරේ කැබලි අංක. 01 සිට 02 දක්වා පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0372 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (02):

1. කැබලි අංක. 01

ඉඩමේ නම: මැදකැල්ල කුඹුර; ඉඩමේ විස්තරය: සිමෙන්ති කාණුව සහ විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: (අත්කර ගන්නා ලද මු. පි. මාර 1935 හි කැබලි අංක. 14 හි කොටසක්); ප්‍රමාණය: හෙක්. 0.0186.

2. කැබලි අංක. 02

ඉඩමේ නම: මැදකැල්ල කුඹුර; ඉඩමේ විස්තරය: සිමෙන්ති කාණුව සහ විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: මැටරඹ කංකානම්ගේ විජිත ලීලානන්ද සිරිවර්ධන ද සිල්වා, අත්කෙන්දහේන, බෙරලැලිය, වැලිගම සහ සිසිලියානා ඉඩිප්පිලි, වැවහේන වත්ත, බෙරලැලිය, වැලිගම; ප්‍රමාණය: හෙක්. 0.0186.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවළුන් හෝ 2017.11.15 වැනි දින අනුව පෙරවරු 10.00 ට වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2017.11.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම /පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

තුෂාරි පී. සූරියආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
වැලිපිටිය.

2017 ඔක්තෝබර් මස 11 වැනි දින,
වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

10-1556

## ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 3/2/3/10/258.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියට යටත්ව අංක 1998/09 හා 2016.10.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 3A සහ 3A පිටුවේ සඳහන් මු. පි. ගම් 4007 කැබලි අංක 07 සහ 08 මැනුම් සංශෝධනය පරිදි කැබලි අංක 25 සහ 26 සහ 27 ලෙස විභජනය වී ඇති අතර කැබලි අංක 07 සහ 08 ට අදාළ ඡේද පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**කැබලි අංක 25**

ඉඩමේ නම: කහටගහවත්ත; විස්තරය: ගෙවත්ත, සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් අවු. 20ක් පමණ වයසැති පොල් ගස් 21ක් කොස් ගස් 01ක් සහ මහෝගනී ගස් 5ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජේ. සී. ජයරත්න, අංක 09, දාරළුව, බෙම්මුල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1423.

**කැබලි අංක 26**

ඉඩමේ නම:–; විස්තරය: පාර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජේ. සී. ජයරත්න, අංක 09, දාරළුව, බෙම්මුල්ල සහ එම්. පී. ජයරත්න, අංක 49/12, පරාක්‍රම පාර, ගම්පහ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0100.

**කැබලි අංක 27**

ඉඩමේ නම: කහටගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 25ක් පමණ වයසැති පොල් ගස් 23ක් කොස් ගස් 10ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. පී. ජයරත්න, අංක 49/12, පරාක්‍රම පාර, ගම්පහ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1728.

ඩී. එම්. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2017 ක් වූ සැප්තැම්බර් මස 08 වැනි දින.
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

10 - 1557

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.